








**සටහන**

- මෙම පත්‍රිකාවේ ඉදිරි කලාප සඳහා සෞඛ්‍යයට සම්බන්ධ ලිපි පල කිරීමට ශ්‍රීලයුවෙබ සාමාජිකයන් හට අවස්ථාව ලබා දී ඇත. ඒ සඳහා කාලීන මාතෘකාවක් පිළිබඳව A4 ප්‍රමාණයේ කඩදාසි දෙකකට සරිලන ලෙස ලිපි සකස් කර පහත විද්‍යුත් තැපෑල/කාර්යාල ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

dteofapm&mh@army.lk / යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධන පුර, කොළඹ.

විමසීම්:– 0112599037/යුහ දිගුව 51025

**From**
Publication
Directorate of Army Preventive Medicine & Mental Health Services
Army Headquarter
Sri Jayewardenepura
Colombo.

**TO**



PUBLIC HEALTH BULLETIN
DIRECTORATE OF
ARMY PREVENTIVE MEDICINE & MENTAL HEALTH SERVICES.
Vol.12 No. 09 DECEMBER 2024

# ඔබට එච්අයිවි ආසාදනය වී ඇත්දැයි දැනගන්නේ කෙසේද?

ඔබ අනාරක්ෂිත ලිංගික හැසිරීමකදී ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය නොකරන්නේ නම්, ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ඕනෑම රෝගයක් ඔබට වැළඳීමේ හැකියාවක් පවතින බව ඔබ දැන සිටියා ද?

**ඔබ එච්අයිවී/ඒඩ්ස් රෝග පරීක්ෂණයක් කළ යුත්තේ කුමන අවස්ථාවේ දී ද?**

ඔබ අනාරක්ෂිත ලිංගික සබඳතාවයක් පැවැත්වූයේ නම්, ඔබ ලිංගික සබඳතා පැවැත්වූ අයට එවැනි රෝගයක් වැළඳී ඇතැයි දැනගතහොත් හෝ, ඔබට ලිංගාශ්‍රිත රෝගයක රෝග ලක්ෂණ ඇතිවී ඇත්නම් ඔබට පරීක්ෂණයක් සිදු කර ඔබේ සෞඛ්‍ය තත්ත්වය විමසා බැලිය හැකිය. ලිංගික අවයවයේ ඇතිවන අසාමාන්‍ය වේදනාව, අසාමාන්‍ය රුධිර වහනය, කැසීම හෝ වණ, මුත්‍රා කිරීමේ දී වේදනාවක් ඇති වීම පොදුවේ ඇතිවන රෝග ලක්ෂණ කිහිපයකි.

නමුත් HIV වැනි රෝගයක් පරීක්ෂණයක් නොකර බාහිරින් හඳුනාගැනීම අපහසුය. HIV ශරීරයට ඇතුළු වීම සහ පරීක්ෂණයකින් වෛරසය හඳුනා ගත හැකි කාලය අතර හෝ වෛරසයට එරෙහිව ශරීරය තුළ වර්ධනය වූ ප්‍රතිදේහ අතර කාල ප්‍රමාදයක් පවතී. එය "කවුළු කාලය" (Window Period)ලෙස හැඳින්වේ. එනිසා ඔබ ඉතා ඉක්මණින් පරීක්ෂා කළහොත්, ඔබට සාවද්‍ය ප්‍රතිඵලයක් ලැබීමට ඉඩ තිබේ.

**එච්අයිවී/ඒඩ්ස් සඳහා පරීක්ෂණයක් කර ගැනීමට හැකිවන්නේ කොහොම ද?**

ඔබට ඕනෑම ලිංගාශ්‍රිත රෝග සායනයකින් HIV සඳහා පරීක්ෂාවක් සිදු කර ගත හැක. ලිංගාශ්‍රිත රෝග සායනවලදී පුහුණු වෛද්‍ය කාර්ය මණ්ඩලය ඔබගේ රහස්‍ය භාවය රැක ගනිමින් පූර්ව සහ පශ්චාත් පරීක්ෂණ උපදේශන කටයුතු සිදු කරති. දිවයින පුරා එවැනි සායන 41 ක් ඇති අතර ඔබට නොමිලේ HIV පරීක්ෂාවක් සිදුකර ගත හැකිය.




**ලිංගාශ්‍රිත රෝග සම්පූර්ණයෙන් සුව කළ හැකි ද?**

සමහර ලිංගාශ්‍රිත රෝග සඳහා ප්‍රතිකාර ඇති අතර, එමගින් එම ලිංගාශ්‍රිත රෝග සම්පූර්ණයෙන්ම සුව කළ හැකිය. සමහර රෝග එහි රෝග ලක්ෂණ සමනය කිරීම මඟින් රෝගය පාලනය කළ හැකිය. බැක්ටීරියා මගින් ඇති වන ලිංගාශ්‍රිත රෝග වලට ප්‍රතිජීවක මගින් ප්‍රතිකාර කළ හැකි නමුත් වෛරස් මගින් ඇති වන ලිංගාශ්‍රිත රෝග පාලනය කළ හැකි වුවද නිට්ටාවට සුව කළ නොහැක. HIV නිට්ටාවට සුව කළ නොහැකි නමුත් වෛරසය පාලනය කළ හැකි අතර, රෝගය පාලනය සඳහා ඔබගේ ජීවිත කාලය පුරාවටම ඖෂධ ලබා ගැනීමෙන් ගුණාත්මක, සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට අවස්ථාව හිමිවේ.



# ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනයක් යනු කුමක්ද? ඉන් ඔබ ආරක්‍ෂා වන්නේ කෙසේ ද?

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත වලට අනුව, ලොව පුරා දිනකට මිලියනයකට අධික පිරිසක් අළුතින් ලිංගිකව සම්ප්‍රේෂණය වන කුමන හෝ ආසාදනයකට (STI) ගොදුරු වේ. නමුත් ලිංගාශ්‍රිත රෝග යනු කුමක් ද? ඒවායේ වර්ග සහ රෝග ලක්‍ෂණ මොනවා ද? අපට ආරක්‍ෂිතව සිටිය හැක්කේ කෙසේ ද? පිළිබඳව ඔබ දැනුවත්ද?

ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනයක් යනු, ලිංගික සංසර්ගයකදී හෝ ලිංගික සම්බන්ධතාවක් හරහා එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට සම්ප්‍රේෂණය වන ආසාදනයකි. මෙම ආසාදනයන් බොහෝ විට රෝග ලක්‍ෂණ නොපෙන්වන අතර හඳුනා ගැනීමට අපහසු වේ. එවැනි ආසාදන ඇතැම් රෝග සමග ඉස්මතු වන විට සහ විශේෂිත රෝග ලක්‍ෂණ පෙන්නුම් කරන විට, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගයක් (STD) ලෙස හඳුන්වයි.

ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන සාමාන්‍යයෙන් ලිංගික සංසර්ගයකදී ලිංගික තරල හුවමාරුවකදී අසාදනය විය හැකි අතර, ඇතැම් ආසාදන ගර්භණී සමයේදී, දරු ප්‍රසූතියේදී හෝ මව්කිරි දීමේදී මවගෙන් දරුවාට සම්ප්‍රේෂණය විය හැකි ය.

## ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන වර්ග මොනවා ද?

ලිංගික සම්බන්ධතා ඔස්සේ සම්ප්‍රේෂණය විය හැකි විවිධ බැක්ටීරියා, වෛරස් සහ පරපෝෂිත ආසාදන රැසක් පවතී. එක් පුද්ගලයෙකු හට එකවර ආසාදන කිහිපයක් ද ඇති විය හැකි අතර, වඩාත් සුලභ ලිංගාශ්‍රිත රෝග වන්නේ සිෆිලික්ස්, ගොනෝරියා, ක්ලැමීඩියා සහ ට්‍රයිකොමෝනියාසිස් ය. මෙම ආසාදන සියල්ලම නිසි ප්‍රතිකාර ලැබීමෙන් සුව කළ හැකි ය.

## රෝග ලක්‍ෂණ මොනවා ද?

ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන සාමාන්‍යයෙන් රෝග ලක්‍ෂණ රහිත හෝ මෘදු රෝග ලක්‍ෂණ පමණක් ඇති කළ හැකි අතර, ඔබ නොදැනුවත්ව ම ඔබට ආසාදනයක් තිබිය හැක. නමුත් රෝග ලක්‍ෂණ නොමැතිව වුව ද, මෙම ආසාදන ලිංගික සංසර්ගයකදී සම්පේෂණය විය හැකි අතර, හානිකර ද විය හැක.

## ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන වල රෝග ලක්‍ෂණ

- ශිෂ්ණයෙන් හෝ යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ලෙස ශ්‍රාවයන් නිකුත් වීම
- ලිංගික ප්‍රදේශයේ තුවාල හෝ ඉන්නන් ඇතිවීම
- වේදනාකාරී හෝ නිතර මුත්‍රා කිරීමට අවශ්‍ය වීම
- ලිංගික ප්‍රදේශයේ කැසීම සහ රතු පැහැය
- මුඛය අවට බිබිලි හෝ තුවාල ඇති වීම
- යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ගන්ධයක් නිකුත් වීම
- ගුද මාර්ගයේ කැසීම, වේදනාව හෝ ලේ ගැලීම
- උදර වේදනාව

## ලිංගාශ්‍රිත රෝග බහුලව දක්නට ලැබෙන්නේ ඇයි?

ලිංගිකත්වය යනු ජීව විද්‍යාත්මක අවශ්‍යතාවයකි. එය බඩගින්නට ආහාර බීම ගන්නවා හා සමාන වන අතර, එය මනුෂ්‍ය ස්වභාවයේ කොටසකි. ඔබ අනාරක්‍ෂිතව ලිංගිකව හැසිරෙන විට ඔබට ලිංගාශ්‍රිත ආසාදන /බෝවන රෝග වැළඳෙන්නට වැඩි අවස්ථාව ඇති අතර ලිංගාශ්‍රිත ආසාදන සංඛ්‍යාව මෙතරම් වැඩි වීමට හේතුව අනාරක්‍ෂිත ලිංගික හැසිරීම් ඉහළයාමයි.

ලිංගාශ්‍රිත ආසාදන බොහෝ විට රෝග ලක්‍ෂණ නොපෙන්වන බැවින්, මිනිසුන්ට නොදැනුවත්වම මෙම ආසාදන බෝවීමේ හැකියාවක් ඇත. තමන් එතරම් නොහඳුනන කෙනෙකු සමග තාවකාලිකව පවත්වන ලිංගික සම්බන්ධතා (casual sex) වටා ඇති සංස්කෘතිය වෙනස් වීම, මිනිසුන්ට ලිංගිකව හැසිරීමට ඇති පහසු ප්‍රවේශය සහ වරකට එක් ලිංගික සහකරුවෙකුට වඩා වැඩි ගණනක් සිටීම සහ dating apps භාවිතය වැඩි වීම නිසා ලිංගාශ්‍රිත ආසාදන රෝග වැළඳීමේ අවදානම වැඩි වෙමින් පවතියි. තමන් ආසාදිතයෙකු බව නොදැන ප්‍රතිකාර නොලබා හෝ ප්‍රතිකාර ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් තවමත් සෑම වසරක ම සැලකිය යුතු පිරිසක් එච්.අයි.වී ආසාදනයෙන් මිය යයි.







## බෝවන රෝගීන් වාර්තා වීම - 2024 නොවැම්බර් මස (ශ්‍රී ලංකා යුද්ධ හමුදාව)

| | ඩෙංගු | | ලාදුරු | | පැපොල | | ලිප්මනයසිස් | | මී උණ | | ක්‍ෂය රෝගය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | A | B | A | B | A | B | A | B | A | B | A | B |
| 1 බලකාය | | 03 | | | | 08 | | 02 | | 03 | | 02 |
| | | | | | | | | | | | | |
| ආසේමු (යා) | 01 | 62 | | 03 | 01 | 14 | | 01 | | 30 | | 05 |
| | තෙලිප්පලෙයි - 01 | | | | තෙලිප්පලෙයි - 01 | | | | | | | |
| ආසේමු(වන්නි) | 01 | 23 | | 05 | | 40 | 01 | 03 | 03 | 43 | | 04 |
| | වවුනියාව - 01 | | | | | | වවුනියාව - 01 | | වවුනියාව - 02<br>මුලතිව් - 01 | | | |
| ආසේමු(නැ) | 02 | 10 | | | 29 | 91 | 01 | 02 | 02 | 09 | | 03 |
| | වැලිකන්ද - 01<br>කල්මුණේ - 01 | | | | හේනානිගල - 27<br>අම්පාර - 01<br>ත්‍රිකුණාමලය - 01 | | පොලොන්නරුව - 01 | | වැලිකන්ද - 01<br>මින්නේරිය - 01 | | | |
| ආසේමු(බටහිර) | 15 | 342 | | 03 | 23 | 108 | | 12 | 08 | 55 | 01 | 10 |
| | පනාගොඩ - 03<br>රත්මලාන - 02<br>බත්තරමුල්ල - 02<br>මෝදර - 01<br>බොරැල්ල - 01<br>වෙනත් - 06 | | | | පුත්තලම - 19<br>පානදුර - 01<br>පනාගොඩ - 01<br>කෑගල්ල - 01<br>කුරුවිට - 01 | | | | පොල්හේන්ගොඩ - 02<br>හෝමාගම - 01<br>හොරණ - 01<br>මැලේවීදිය - 01<br>වෙනත් - 03 | | කටුබැද්ද - 01 | |
| ආසේමු(මධ්‍යම) | 03 | 24 | | | 02 | 04 | | 01 | 03 | 24 | | 01 |
| | මහනුවර - 01<br>හම්බන්තොට - 01 | | | | හම්බන්තොට - 02 | | | | මහනුවර - 01<br>කොත්මලේ - 01<br>හම්බන්තොට - 01 | | | |
| එකතුව | 22 | 464 | 00 | 15 | 55 | 242 | 02 | 21 | 16 | 164 | 01 | 26 |

A = මෙම මාසය තුල වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව

B = මෙම වසර තුල වාර්තා වූ මුළු රෝගීන් සංඛ්‍යාව



# එන්නතකින් මට්ටු කළ නොහැකි ගොනෝරියාව

නයිසර් නම් තරුණ ජර්මානු වෛද්‍යවරයකු 1879 දි ජර්මනියේ බ්‍රෙස්ලව් නගරයේ චිකිත්සාගාරයක සහයකයෙකු ලෙස සේවය කරමින් සිටියේය. ලොව පුරා පැතිර ගිය ලිංගාශ්‍රිත බෝවන රෝගයක් වූ ගොනෝරියාව පිළිබඳව අධ්‍යයනය කළ ඔහුගේ මිළග අරමුණ වූයේ ගොනෝරියා රෝගකාරකය හඳුනා ගැනිමය. ගොනෝරියා රෝගියකුගෙන් ලබා ගන්නා ලද මස්තු ඔහු දැඩි අවධානයෙන් යුතුව අන්වීක්ෂය තුළින් අධ්‍යයනය කර එකට ඇළුණු බනිස් ගෙඩි දෙකක හැඩය ගත් ද්විත්ව කොකස බැක්ටිරියාවෝ ඉතා පැහැදිලිව ඔහුට දැක ගත හැකි විය. Neisseria gonorrhoeae බැක්ටිරියාව ඔහු ලොවට හඳුන්වා දෙන්නේ එසේය.


## ගොනෝරියා බැක්ටීරියාව මිනිස් ශරීරයේ ව්‍යාප්තවීම

ගොනෝරියා රෝගය බෝ වන්නේ අනාරක්ෂිත ලිංගික හැසිරීම් හේතුවෙනි. නිරෝගී පුද්ගලයකුගේ සිරුරට ඇතුළු වන රෝග කාරක බැක්ටිරියාවෝ මහා පරිමාණ ආක්‍රමණයකට සැරසෙති. යෝනි මාර්ගයේ හෝ මුත්‍රා මාර්ගයේ ශ්ලේෂ්මල බිත්තියට කෙදි වැනි පිලයි මගින් සවි විම ඔවුන්ගේ ගමන් මගෙහි මුල්ම පියවර වේ. ශ්ලේෂ්මල පටලයට ඉතා තදින් ඇලෙන බැක්ටීරියාවෝ ධාරක සෛල අතර පිහිටි හිදැස් හරහා අභ්‍යන්තර පටක තුළට ගමන් කරති. ආසාදනට හටගෙන දින 2-8 කට පමණ පසු මුල් රෝග ලක්ෂණ මතු වන විටත් මෙම රෝග කාරක බැක්ටීරියා ක්‍රම ක්‍රමයෙන් සිරුරේ විවිධ ඉන්ද්‍රිය කරා ගමන් කරති. රෝගියකුගේ ලිංගික පද්ධතියෙන් පිටවන ස්‍රාවයන්හි ගොනෝරියා බැක්ටීරියාවෝ විශාල ප්‍රමාණයක් අඩංගු වන අතර, මිනිසාගේ ලිංගික පද්ධතියෙහි අවයවයන් ආසාදනයට ලක් කරනු ලබයි.

## රෝග ව්‍යාප්තිය සිදු වන්නේ කෙසේද?

ගොනෝරියාව මිනිසාගෙන් මිනිසාට බෝවන ලිංගාශ්‍රිත බෝවන රෝගයකි. එබැවින් රෝගයේ ප්‍රභවයද, ගොදුරද මිනිසාම වේ. ගොනෝරියා රෝගියෙකු හෝ රෝග වාහකයකු සමග අනාරකක්ෂිත ලිංගික ඇසුරකට යොමු වීමෙන් එම රෝගය නිරෝගී පුද්ගලයන්ට සම්ප්‍රේෂණය වෙයි.

බොහෝ විට ආසාදිත කාන්තාවන් රෝග ලක්‍ෂණ නොපෙන්වන හෙයින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු නොවන බැවින් රෝග වාහකයන් ලෙස ක්‍රියා කිරීමේ හැකියාවක් ඇත.



ගොනෝරියා රෝගයට වැඩිහිටියන් පමණක් නොව කුඩා දරුවන් ද ගොදුරු විය හැක. ආසාදිත මවකට දාව උපදින දරුවා ගොනෝරියා ආසාදනයට ලක් වීමට බොහෝ ඉඩකඩ ඇත.

ගොනොකොකස අක්‍ෂි ආසාදනය අලුත උපන් දරුවන් අතර දක්නට ලැබෙන රෝගයකි. ආසාදිත මවකගේ උපත් මාර්ගය හරහා බිහිවන දරුවකු බොහෝ විට මෙවන් ආසාදනයට ලක්වේ.



(ගොනෝකොකස අක්ෂි ආසාදිත දරුවකු)

## රෝග ලක්‍ෂණ

රෝගකාරක බැක්ටීරියාවෝ කාන්තා හෝ පුරුෂ මුත්‍රා මාර්ගය, කාන්තාවන්ගේ යෝනි මුඛය හා යෝනි මාර්ගය ආසාදනය කරති. බොහෝ අවස්ථාවලදී ආසාදනය වූ කාන්තාවන් කිසිදු රෝග ලක්‍ෂණයක් නොපෙන්වා රෝග වාහකයන් ලෙස ක්‍රියා කරති.





බැක්ටිරියාව ආසාදනය වි දින 10ක් පමණ ගත වූ පසු පිරිමින් අතර රෝග ලක්‍ෂණ පෙන්වීමට පටන් ගන්නා අතර, මුත්‍රා පහකිරිමේදි ඇති වන වේදනාව, කහ - සුදු පැහැති දියරයක් ශිෂ්ණය කෙළවරින් ස්‍රාවය වීම මුල් රෝග ලක්‍ෂණ ලෙස ඇතිවේ.



(ශිෂ්ණය කෙළවරින් කහ/සුදු පැහැති දියරයක් පිටවීම)

මෙම රෝගයට නිසි කල ප්‍රතිකාර ලබා නොගත හොත් ලිංගික අවයව ආසාදනය මුල් කොට පසුකාලීනව විවිධ සංකූලතා ඇතිවිය හැකි අතර කාන්තාවන් වඳ භාවයට පවා පත් විය හැකිය. රෝගකාරක බැක්ටීරියාවෝ තැවරුණු දෑත්වලින් අස් පිරිමැදිමෙන් රෝගියාගේ අක්‍ෂි පටලද ආසාදනය වීමට ඉඩ ඇත. සන්ධි ප්‍රදාහය, හදවත් පේෂි ආසාදනය, ආවෘතිදාහය ආදී සංකීර්ණ රෝග ලක්‍ෂණද ඇති වේ. ගොනෝරියා බැක්ටීරියාවෝ රුධිරය ආක්‍රමණය කළ විට අත් හා පාද ආශ්‍රිත තුවාල, බිබිලි මතුවීම හා සන්ධි ප්‍රදාහය යන රෝග ලක්‍ෂණ හටගනි.



## වළක්වා ගැනීම හා ප්‍රතිකාර

ගොනෝරීයා රෝගය පැතිර යාම වැලැක්වීමට ගත හැකි වැදගත් පියවර රැසකි. ඉන් ප්‍රධාන තැන ගන්නේ මහජනයා (විශේෂයෙන්ම අවදානම් සහිත ජන කොටස්) මෙම රෝගය පිළිබඳව නිවැරදිව දැනුවත් විමයි. අවදානම්/සැකසහිත අයවළුන් ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකක වෙත යොමුකර ලිංගාශ්‍රිත රෝග සඳහා පරීක්‍ෂා කර ගැනිමට ඔවුන් උනන්දු කරවීම තුළින් රෝගීන් හා රෝග වාහකයන් හඳුනා ගැනිම රෝග ව්‍යාප්තිය පාලනය කල හැකි වඩාත් කාර්යක්‍ෂම ක්‍රමයකි. මුල් අවධියේදිම රෝගින් හඳුනා ගැනීම මගින් රෝගය පැතිරයාම වැලැක්වීමටත්, හඳුනාගන්නා රෝගීන්ට නිසි ප්‍රතිකාර ලබා දී නිට්ටාවටම සුව කිරීමටත් හැකියාව ලැබේ. මෙය බැක්ටීරියා මගින් ව්‍යාප්තවන බෝවන රෝගයක් වන බැවින් මුල් අවස්ථාවේදීම හඳුනා ගෙන නිසි කලට නිසි ප්‍රතිකාර ලබාදීම මගින් නිට්ටාවටම සුව කල හැක.

## වළක්වා ගැනීම හා ප්‍රතිකාර

- ❖ ගොනෝරියාව නිට්ටාවටම සුව කළ හැකි බෝවන රෝගයකි.
- ❖ ගොනෝරියා රෝගකාරකය Neisseria gonorrhoeae නම් බැක්ටිරියාවකි.
- ❖ මෙය ලිංගාශ්‍රිත බෝවන රෝගයකි. එය අනාරක්‍ෂිත ලිංගික ඇසුර මගින් බෝවේ.
- ❖ ගොනෝරියා බැක්ටිරියා මිනිසා තුළ දිගු කාලීන ප්‍රතිශක්තියක් ඇති නොකරන හෙයින් අනාරක්‍ෂිත ලිංගික ඇසුර පවත්වන ඕනෑම අවස්ථාවක නැවත නැවත වැළඳිය හැක.




දත්ත මූලාශ්‍ර:-
ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ඒකක වෙබ් අඩවිය හා පොත පත ඇසුරින්

සකස් කලේ:-
සෙ/654028 ලා/කෝ විමලසේන කේපිඑම්අයි
ක්ෂේත්‍ර සහයක (මහජන සෞඛ්‍ය)
හසෞභානිවෙ අංශය
රණවිරු සෙවණ - රාගම